# PIC YOUR VALUES

## “ඔබ අගය කරන සාරධර්ම ඡායාරූපයට නගන්න”

## ඡායාරූප තරගාවලිය

---

මින් අදහස් වන්නේ කුමක් ද?
ආසියා පදනම ‘සියල්ලන්ට සාරධර්ම’ (‘values4all’) නමින් වැඩසටහනක් දියත් කර ඇත. එය එම වැඩසටහන යටතේ ඡායාරූප තරගාවලියක් පැවැත්වීමට යයි. සියලු ම ආධුනික ඡායාරූප ශිල්පීන්ට මේ සඳහා සහභාගි විය හැකි ය. ඔබ කළ යුත්තේ මෙය යි: ශ්‍රී ලංකාව වඩාත් යහපත් රටක් බවට පත් කිරීමට ඔබ පෙලඹෙන්නේ කුමක් නිසා දැයි ඔබ ම සිතා බලන්න; ඉන් පසුව ඔබගේ එම සිතිවිලි ඡායාරූපයට නගන්න; අනතුරුව අනෙක් අයටත් ඒවා පෙන්වන්න. මෙම ඡායාරූප තරගාවලිය අංශ හයක් යටතේ පැවැත්වීමට නියමිත ය. ඒ සඳහා පදනම් කර ගෙන ඇත්තේ සමාජයට වඩාත් ම වැදගත් වන සාරධර්ම හයකි. ඒවා මෙසේ ය: ඉවසීම, සාමය, කරුණාව, එක්ව කටයුතු කිරීම, ගෞරවය, අවංක භාවය.

සහභාගි විය හැක්කේ කාට ද?
2018 අප්‍රේල් 30 දින වන විට, අවුරුදු 18-29 අතර වයසේ පසු වන ඕනෑ ම කෙනෙකුට මේ සඳහා සහභාගි විය හැකි ය.

සහභාගි වන්නේ කෙසේ ද?

1. ඉහත දැක්වෙන සාරධර්මවලින් එකක් විස්තර වන පරිදි ඡායාරූපයක් අර ගන්න.
2. ඔබට ඡායාරූප 3ක් එවිය හැකි ය; එහෙත් එක් සාරධර්මයකට අදාළව එවිය හැක්කේ එක් ඡායාරූපයක් පමණකි.
3. ඔබ ගත් ඡායාරූපය (හෝ ඡායාරූප) ඉන් විස්තර වන සාරධර්මය හඳුන්වන නම යොදා ගනිමින් save කරන්න. (උදාහරණයක් ලෙස, ඔබ එවන්නේ ‘ඉවසීම’ විස්තර වන පරිදි නිර්මාණය කළ ඡායාරූපයක් නම්, ඔබ එය save කළ යුත්තේ ‘ඉවසීම’ යන නම යොදා ගනිමිනි.)
4. ඔබගේ ඡායාරූපය (හෝ ඡායාරූප) අප වෙත යොමු කිරීම සඳහා මෙම විද්‍යුත් තැපෑල යොදා ගන්න: picyourvalues@gmail.com
5. ඔබ එවන විද්‍යුත් තැපෑලෙහි පහත සඳහන් තොරතුරු ඇතුළත් කරන්න:
    - සම්පූර්ණ නම

- උපන් දිනය
- ජාතික හැඳුනුම්පත් අංකය
- පදිංචි ලිපිනය
- ඇමතුම් අංක (හැකි නම්, ස්ථාවර දුරකථන අංකයක් සහ ජංගම දුරකථන අංකයක්)
- ඡායාරූපයට නමක් සහ ඡායාරූපයෙන් ඔබ තෝරා ගත් සාරධර්මය විස්තර වන ආකාරය පැහැදිලි කරමින් කෙටි විස්තරයක් (එක් ඡායාරූපයක විස්තරය වචන 50කට නොවැඩි විය යුතු ය)

සහභාගි විය යුත්තේ ඇයි?

- සමස්ත තරගාවලියේ ජයග්‍රාහකයාට CameraLK අනුග්‍රහයෙන් රු. 50,000ක තෑගි වවුචරයක් හිමි වනු ඇත.
- සමස්ත තරගාවලියේ ජයග්‍රාහකයාට සහ එක් එක් අංශයේ අවසන් ජයග්‍රාහකයන් තුන් දෙනාට ශ්‍රී ලංකා ඡායාරූප ශිල්පීන්ගේ සංගමය විසින් පදක්කම් ද ආසියා පදනම විසින් සහතික පත් ද පිරිනැමෙනු ඇත.
- ජයග්‍රාහී ඡායාරූප සඳහා ත්‍යාග කට්ටලයක් ද පිරිනැමෙනු ඇත.
- ආසියා පදනම විසින් නිර්මාණය කොට ඉදිරියේ දී දියත් කෙරෙන 'values4all' වෙබ් අඩවිය මගින් සහ ඇන්ඩ්‍රොයිඩ් ජංගම දුරකථන මෘදුකාංගය මගින්, ජයග්‍රාහී ඡායාරූප සහ අවසන් වටයට තේරුණු ඡායාරූප, අදාළ ඡායාරූප ශිල්පීන්ගේ විස්තර ද සහිතව, ප්‍රසිද්ධ කෙරෙනු ඇත.

**ඉදිරිපත් කරන ඡායාරූපවල තිබිය යුතු තාක්ෂණික ගුණාංගඃ**

- ඡායාරූප JPEG ආකෘතියෙන් save කළ යුතු ය.
- ඡායාරූපවල විශාලත්වය 500KB නොඉක්මවිය යුතු ය.
- ඡායාරූපවල උපරිම පළල pixel 1400 සහ උපරිම උස pixel 1050 විය යුතු අතර, එම සීමාව නොඉක්මවිය යුතු ය (බෝඩරයක් යොදන්නේ නම්, එය ද එම සීමාව ඇතුළත තිබිය යුතු ය).
- ඡායාරූපවල විභේදනය (resolution) dpi 300 නොඉක්මවිය යුතු ය.
- ඡායාරූප වෛවර්ණ ස්වරූපයෙන් හෝ තනි වර්ණයකින් ඉදිරිපත් කළ හැකි ය.
- ජංගම දුරකථනයක් හෝ ඩිජිටල් කැමරාවක් යොදා ගෙන ඡායාරූප ගත හැකි ය.

ජයග්‍රාහකයන් තෝරනු ලබන්නේ විනිශ්චය මණ්ඩලයක් විසිනි. ශ්‍රී ලංකා ඡායාරූප ශිල්පීන්ගේ සංගමය, ආසියා පදනම, ජාතික තරුණ සේවා සභාව සහ Sri Lanka Unites යන ආයතන හා සංවිධානවල නියෝජිතයන්ගෙන් එම විනිශ්චය මණ්ඩලය සමන්විත වේ.

තරගාවලිය සඳහා ඡායාරූප ඉදිරිපත් කළ හැකි අවසන් දිනයඃ 2018 අප්‍රේල් 30